**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

# නීති නිලධාරි තනතුර (කොන්ත්‍රාත් පදනම මත)

## 1.0 කාර්යය / වගකීම්:

- නීති උපදෙස් සහ අදහස් ලබා දීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හා ශ්‍රී ලංකා මහ බැංකුවට එදිරිව ගොනු කර ඇති නඩු කටයුතුවල දී අධිකරණයේ පෙනී සිටීම සහ ඒ හා සම්බන්ධ සියලු කටයුතු මෙහෙයවීම.
- අවශ්‍ය අවස්ථාවල දී විනිශ්චය සභා, කොමිෂන් සභා ආදී අනෙකුත් නීතිමය ආයතන ඉදිරියේ පෙනී සිටීම.
- ගිවිසුම්/නියෝග/මාර්ගෝපදේශ/චක්‍රලේඛ/රෙගුලාසි ආදිය කෙටුම්පත් කිරීම සහ සමාලෝචනය කිරීම.
- නීති ප්‍රතිසංස්කරණවලට අදාල කටයුතු සඳහා සහභාගී වීම.
- අවශ්‍ය විටෙක මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩලීම සම්බන්ධයෙන් ඉහත සඳහන් කළ කාර්යයන්හි නිරත වීම.
- කළමනාකාරිත්වය/දෙපාර්තමේන්තු ප්‍රධානියා/අධීක්ෂක නිලධාරියා විසින් පවරනු ලබන වෙනත් අදාළ කාර්යයන්හි නිරත වීම.

## 2.0 අවශ්‍ය අවම අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද:

### 2.1 අධ්‍යාපන සුදුසුකම්:

(අ) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ පළමු පංතියේ සාමාර්ථයක් (1st Class) හෝ දෙවන පංතිය ඉහළ පෙළ සාමාර්ථයක් (2nd Class Upper Division) හෝ ශ්‍රේණි ලකුණුවල සාමාන්‍යය (GPA) 4.0 කින් අවම වශයෙන් 3.5 ක් හෝ බර තැබූ සාමාන්‍ය ලකුණු අවම වශයෙන් 75% ක් සහිත නීතිය පිළිබඳ ප්‍රථම උපාධියක් (LLB), **හෝ**

(ආ) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් පරීක්ෂණයේදී (Attorney-at-Law final examination) පළමු පංතියේ ගෞරව සාමාර්ථයක් (1st Class Honours pass), **හෝ**

(ඇ) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් (LLM)

### 2.2 පළපුරුද්ද:

ලියාපදිංචි නීති සමාගමක හෝ රජයේ ආයතනයක/මූල්‍ය අංශයේ ආයතනයක, අධිකරණ/නීතිමය කටයුතුවල අවම වශයෙන් වසර 10 ක පළපුරුද්දක් තිබිය යුතුය.

බලපත්‍රලාභී බැංකුවක/මූල්‍ය ආයතනයක විධායක මට්ටමේ පළපුරුද්දක් ඇති නීතිමය ලියකියවිලි කෙටුම්පත් කිරීම හා සකස් කිරීම, හා නීතිඥ කටයුතු සඳහා උපදෙස් දීම, නීති, රෙගුලාසි හා පනත් වලට අදාළ නීතිමය කරුණු, පනත් කෙටුම්පත්, චක්‍රලේඛ හා රෙගුලාසි වැනි නීතිමය ලියකියවිලි සකස් කිරීම සහ මහජන නඩුකර සම්බන්ධව පළපුරුද්දක් සහිත අපේක්ෂකයින් සඳහා විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

බැංකු හෝ මූල්‍ය සම්බන්ධව පශ්චාත් උපාධියක් තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

- අපේක්ෂකයින් ප්‍රශස්ත වාචික හා ලිඛිත සන්නිවේදන කුසලතාවලින් හෙබි විය යුතු අතර රහස්‍ය හා සංවේදී තොරතුරු මැනවින් හැසිරවීමේ හැකියාව තිබිය යුතුය. තෝරාගත් අයදුම්කරුවන් "අනාවරණය නොකිරීමේ ගිවිසුමකට" එළැඹීමට කැමැත්ත ප්‍රකාශ කළ යුතුය.

**අයදුම්පත සමග අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කිරීමට අදාළ සහතිකවල ඡායා පිටපත් යොමු කිරීමට අයදුම්කරුවන් විසින් වග බලා ගත යුතුය. ඉහත ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවක දී ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.**

## 3.0 වයස:

2024.03.04 දිනට වයස අවුරුදු 45 ට අඩු විය යුතුය.

## 3.0 රැකියාව:

කොන්ත්‍රාත් පදනම මත වසර තුනකට (03) නොවැඩි කාලයක් සඳහා බඳවා ගැනේ. ආරම්භයේ දී වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කරනු ලබන අතර කාර්ය සාධනය මත පදනම්ව වසර අවසානයේ දී සේවා ගිවිසුම දීර්ඝ කිරීමට සලකා බලනු ඇත.

## 4.0 වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ:

සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වය සහිතව රු. 450,000.00 ක (බදු ගෙවිය යුතු) මාසික දීමනාව

## තෝරා ගැනීමේ ක්‍රමවේදය

සම්මුඛ පරීක්ෂණ එකක් හෝ කිහිපයක් මගින් තෝරා ගැනෙනු ඇත.

## අයදුම්පත්

අයදුම්පතෙහි නියමිත ආකෘති පත්‍රය, https://www.cbsl.gov.lk/en/careers යන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

නියමිත ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් පමණක් ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් වග බලා ගත යුතු අතර, අවශ්‍ය සියලු ලිපි ලේඛන සහිතව නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2024.03.04 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ/මානව සම්පත් වෙත ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමු කළ යුතුය.

අයදුම්පත් එවීමේ දී "නීති නිලධාරි තනතුර (කොන්ත්‍රාත් පදනම මත)" යනුවෙන් ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අපේක්ෂිත සුදුසුකම් සම්පූර්ණ කර නොමැති තැනැත්තන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබන අතර අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත්, අයදුම්පත් භාර ගන්නා දිනට පසු ලැබෙන අයදුම්පත් සහ නියමිත ආකෘතිපත්‍රයෙන් බැහැර අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සහතිකපත් පරීක්ෂාවේ දී අදාළ සහතිකපත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් කවර හේතුවක් යටතේ හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් සේ සලකනු නොලැබේ.

තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ.

බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීම, බඳවා ගැනීම කල් දැමීම හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය. සම්මුඛ පරීක්ෂණ/ය සඳහා කැඳවීමේ දී අයදුම්කරුවන්ගේ අධ්‍යාපනික සුදුසුකම්වලින් ආවරණය වන විෂයය ක්ෂේත්‍රයන්හි අදාළබව සහ බැංකුවේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි ඔවුන්ගේ සේවා පළපුරුද්දෙහි අදාළබව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය.

බඳවාගැනීමේ නිර්ණායක අනුව සුදුසුකම් ලබන අපේක්ෂකයන් පමණක් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඊළඟ පියවර සඳහා කැඳවනු ලැබේ.


**අධ්‍යක්ෂ – මානව සම්පත්**
**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.**
**දුරකථන: 011-2477330 ෆැක්ස්: 011-2477715**